රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/89

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1989 ජනවාරි මස 31 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත.

## රාජ්‍ය අංශයේ විශාල සංවිධානයන්හි කළමනාකරණ සංවර්ධන ඒකක පිහිටුවීම

ශ්‍රීමත් ජනාධිපතිතුමාණන් විශේෂයෙන්ම "ජනසවිය" වැඩසටහන සම්බන්ධයෙන් පරිපාලනය පිළිබඳ ඇතැම් වැදගත් ප්‍රකාශයන් කර තිබේ. නිලධාරිවාදය නැති කිරීම, ක්‍රියාපටිපාටි සරල කිරීම හා ප්‍රමාදයන් වැළැක්වීමේ අවශ්‍යතාවය ගැන එතුමා අවධාරණයෙන්ම සඳහන් කළේය.

02. ඉහත සඳහන් අරමුණු සඵල කර ගැනීම සඳහා සෑම අමාත්‍යාංශයක්ම, දෙපාර්තමේන්තුවක සහ ආයතනයක්ම තම කටයුතු නිරතුරුවම සමාලෝචනය කොට මෙහෙයවීම අවශ්‍යය. මෙය ඉටුකර ගැනීමේදී අතිශයින්ම සාර්ථක අත්දැකීම් බලපාන ක්‍රම අතුරින් එකක් වන්නේ අවශ්‍ය කටයුතු විමසුම් කොට යෙදිය යුතු ප්‍රතිකර්ම වහාම නිර්දේශ කළ හැකි තමන්ගේම අංශයක්, සෑම අමාත්‍යාංශයක් සහ සියලුම විශාල සංවිධාන විසින් පිහිටුවා ගැනීමයි. ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ පුහුණු හා සංවර්ධන අංශය කච්චේරිවල පුහුණු හා කළමනාකරණ ඒකක පිහිටුවා පසුගිය වසර කීපයතුළදී මෙබඳු කළමනාකරණ සංවර්ධන කාර්යයන්හි නිරතවී කාර්යාභිවර්ධන කව සහ කළමනාකරණ තරග වැනි වැඩසටහන් මගින් නව කළමනාකරණ උපායමාර්ග ආරම්භකොට තිබේ. පරිපාලන ප්‍රතිසංස්කරණ කමිටුව අංක 5 දරණ තම වාර්තාව මගින් රජය වෙත නිර්දේශ මාලාවක් ඉදිරිපත් කොට තිබෙන අතර ඒ අනුව අමාත්‍යාංශවලද දීපව්‍යාප්තව පිහිටි සියලුම දෙපාර්තමේන්තුවල සහ පලාත් සභාවලද පුහුණු අංශ/ඒකක පිහිටුවීම නිර්දේශ කර තිබේ. එම යෝජනා පිළිබඳව රජය විසින් ඇත් කරුණු හදාරාගෙන යන අතර ශ්‍රීමත් ජනාධිපතිතුමාණන් විසින් සඳහන් කරන ලද පරමාර්ථ ඉටුකර ගැනීමේ අරමුණින් වහාම ගතයුතු පියවරක් වශයෙන් එක් එක් විශාල සංවිධානයක් ද අමාත්‍යාංශයක් සහ පලාත් සභාවක් ද තමන්ගේම කාර්යභාරයන් ඉටුකෙරෙන ආකාරය පරීක්ෂා කිරීම අවශ්‍යව තිබේ. මේ සඳහා එක්තරා විශේෂ ක්ෂේත්‍රයන් හා ගැටළු ගැන උපදේශාත්මක හැදෑරීම් කරනු සඳහා විශේෂඥ ආයතනවල සේවය ලබාගත යුතු අතර දැන් තිබෙන ගැටළු පරීක්ෂාකොට ඒවාට ප්‍රතිකර්ම යොදනු පිණිස තමන්ගේම සංවිධාන කාර්යයන්හි නිරත කරවීම අදාල සංවිධානවල ප්‍රධානයන්ගේ වගකීම ද වනු ඇත.

03. විවිධ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් ප්‍රයෝජනයට ගනු ලබන නවෝත්සාහී කාර්යයන්, සාර්ථක වැඩසටහන් හා කළමනාකරණ අත්හදා බැලීම් ප්‍රකාශන (පත්‍රිකා, තොරතුරුලිපි) සම්මන්ත්‍රණ සහ දේශන මගින් බෙදාහැරීමෙන් මෙම කටයුතුවල නිරතවීම දිරිගැන්වීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය බලාපොරොත්තුවේ.

/..2

04. එම නිසා ශ්‍රීමත් ජනාධිපතිතුමාණන් විසින් විශේෂයෙන් සඳහන් කරන ලද එම පරමාර්ථ සඵල කර ගැනීම සඳහා ඔබ වහාම ක්‍රියාකිරීම අවශ්‍යවන අතර ඒ පිළිබඳ ඔබ ගත් ක්‍රියාමාර්ගය සහ ක්‍රියාපරිපාටි සරලකොට අනවශ්‍ය ප්‍රමාද වැලැක්වීමට ගත් විශේෂ පියවර ද සම්බන්ධයෙන් මෙම අමාත්‍යංශයට වාර්තා කිරීම ද අවශ්‍යවේ. ඔබේ වාර්තාව පහත සඳහන් ආකාරයෙන් සැකසීම ප්‍රයෝජනවත් වනු ඇත.

(අ) දැනට පවතින ක්‍රියාපරිපාටිය

(ආ) යෝජනා කරනු ලැබ ක්‍රියාත්මකවන නව ක්‍රියාපරිපාටිය

(ඇ) නව ක්‍රියාපරිපාටියෙන් ලැබෙන වාසි

මෙම වාර්තා සෙසු අමාත්‍යංශ සහ දෙපාර්තමේන්තුවලට ප්‍රයෝජනවත් විය හැකි වන අතර අවශ්‍ය වේ නම් සාකච්ඡා හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීමට ද ඒවා උපයෝගී කරගත හැකිය. තවද, සංකීර්ණ ගැටළු පවතින ක්ෂේත්‍රයන්හි වැඩිදුර අධ්‍යයනය කිරීමට සහ ගැඹුරු ලෙස කරුණු හැදෑරීම සඳහාත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වැනි ආයතන මෙහෙයවීමට මෙම අමාත්‍යංශයට හැකිවනු පිණිස එම වාර්තා ප්‍රයෝජනවත් විය හැකිය.

05. මෙම කරුණු පිළිබඳ එවන ලිපි 'ලේකම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය, කලමනාකරණ සංවර්ධන අංශය, නිදහස් චතුරශ්‍රය, කොළඹ 7' යන ලිපිනයට එවිය යුතුය.

06. මෙම ලිපිය ලැබුණු බව කරුණාකර දන්වන්න.

(සිරිල් ගමගේ)
වැඩබලන ලේකම්
රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය.

සිරි/